MINISTRY OF ENVIRONMENT

MARINE ENVIRONMENT PROTECTION AUTHORITY



# MEPA NEWS LETTER

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ 2024 වසර තුල  සිදු කරන ලද කාර්යභාරයෙන් බිදක් මාධ්‍ය ඇසින් .

# ආයතනයේ කාර්යභාරය

- 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත ක්‍රියාවට නැංවීම

- සමුද්‍ර දූෂණය වැළැක්වීම, අවම කිරීම සහ පාලනය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- සමුද්‍ර දූෂණය වැළැක්වීම, අවම කිරීම සහ පාලනය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- පෙට්‍රෝලියම් සහ ස්වභාවික සම්පත් ගවේෂණයේදී සමුද්‍ර පරිසරයට ඇතිවන බලපෑම් නියාමනය කිරීම

- සමුද්‍ර පරිසරය පිළිබඳව දැනුවත්භාවය ඇතිකරවීම සහ සමුද්‍ර පරිසරයට අදාල පර්යේෂණ සිදුකිරීම

- සමුද්‍ර පරිසර දූෂණයට අදාල අන්තර්ජාතික සම්මුතීන් සහ කෙටුම්පත් නිර්දේශ කිරීම

- සමුද්‍ර දූෂණ ක්‍රියාවන්ට එරෙහිව නීති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම
- නෞකා සඳහා අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් සැපයීම

- නෞකා අතර සිදුවන බංකරින් ක්‍රියාවන් නියාමනය කිරීම

# MEPA NEWS LETTER

MARINE ENVIRONMENT PROTECTION AUTHORITY


## This Year's Beach Cleanup Program

DATE - 2024.01.30

### ත්‍රිකුණාමලය සමුද්‍රාගම වෙරළ තීරය පිරිසිදු කිරීම





සමුද්‍රීය පරිසර ආරක්ෂිණ අධිකාරියේ ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලය මෙහෙයවීමෙන් ත්‍රිකුණාමලය සමුද්‍රාගම වෙරළ තිරය පිරිසිදු කිරීමේ වැඩසටහනක් 2024.01.30 පැවැත්විණ. එම වෙරළ තීරයේ භූගෝලීය පිහිටීම හේතුවෙන් සහ මේ දිනවල වාරකන් හේතුවෙන් මෙම වෙරළ තීරයට නිරන්තරයෙන් අපද්‍රව්‍ය ගසාගෙන ඒමේ ප්‍රවණතාවක් පවතී. මේ අනුව නිරන්තරයෙන් එම වෙරළ තීරය පිරිසුදු කිරීමට සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලය කටයුතු යොදා ඇත.

DATE - 2024.03.19

### සමුද්‍ර පරිසර හිතකාමී වැඩසටහන්

සමුද්‍රීය පරිසර ආරක්ෂන අධිකාරිය ගාල්ල ප්‍රාදේශීය කාර්යාලය සංවිධානයෙන් ගාල්ල උනවටුන වෙරළ තීරය ආශ්‍රිත ප්‍රදේශයේ සමුද්‍ර පරිසර හිතකාමී වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරන ලදි.මෙහිදී වෙරළ පවිත්‍රතා වැඩසටහන්, මුහුදු පත්ල පිරිසුදු කිරිමේ වැඩසටහන්, මෙන්ම සමුද්‍රීය පරිසරය රැකගනීමේ ඇති වැදගත්කම පිලිබදව ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ද පැවැත්විණි.
මෙම වෙරළ පවිත්‍රතා කටයුතු වලදී සමුද්‍රීය අපද්‍රව්‍ය ටොන් 1.5 පමණ ප්‍රමාණයක් එකතුවූ අතර මෙම කාර්යන් සදාහා 200 ක පමණ පිරිසක් සහභාගි විය .සමුද්‍රීය පරිසරය ආරක්ෂන අධිකාරිය සංවිධානයෙන් සිදුකරනු ලැබූ මෙම වැඩසටහන් සදහා මොරටුව විශ්වවිද්‍යාලයීය Rotaract Club සිසු සිසුවියන්ගේ පූර්ණ සහයෝගය ලබාදුණි. එසේම මේ සදහා හබරාදූව ප්‍රා.ලේකම් කාර්යාලය, ප්‍රදේශයේ ජනතාවගේ සහ sundiving කිමිදුම් මධ්‍ය ස්ථානයේ සහයෝගය ලබාදෙන ලදි.

DATE - 2024.09.14

### මීගමුව සරක්කුව වෙරළ තීරයේදී ජාත්‍යාන්තර වෙරළ පවිත්‍රතා දිනය සහ ජාතික සමුද්‍ර සම්පත් සුරැකීමේ සතිය ,

ජාත්‍යාන්තර වෙරළ පවිත්‍ර කිරීමේ දිනය සහ ජාතික සමුද්‍ර සම්පත් සුරැකීමේ සතිය නිමිත්තෙන් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය මගින් සංවිධානය කල වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහනක් 2024 සැප්තැම්බර් මස 14 වන දින මීගමුව,සරක්කුව වෙරළ තීරයේදී පැවැත්විණි. මේ සඳහා වෙරළ ආශ්‍රිත ප්‍රජාව, පාසල් සිසුන්, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ නිලධාරීන් ඇතුළු 150 කට අධික පිරිසකගේ සහභාගීත්වයෙන් සිදු කෙරුණු අතර මේ වැඩසටහන සඳහා clean force සංවිධානයේ දායකත්වය ද ලැබුණි. මෙහිදී සමුද්‍රීය කසළ පිළිබඳව සහ එම කසළ වල වෙළඳ නම් පිළිබඳව සංගණනයක් ද සිදු කෙරුණි.



MEPA NEWS LETTER

MARINE ENVIRONMENT PROTECTION AUTHORITY

# This Year's Beach Cleanup Program

DATE - 2024.04.22

## හික්කඩු වෙරළ තීරය සම්පූර්ණයෙන්ම පිරිසුදු කරයි

නීති විරෝධී ලෙස මෙන්ම අවිධිමත් ලෙස කසල බැහැර කිරීම හේතුවෙන් හික්කඩුව වෙරළ තීරය අපවිත්‍ර වී ඇති බවට පසුගියදා මාධ්‍ය මගින් වාර්තා කර තිබූ අතර ඒ සඳහා වහාම ක්‍රියාත්මකවූ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය එහි සභාපති අසේල බී.රේකව මහතාගේ සහ සාමාන්‍යාධිකාරී තුමාගේ උපදෙස් මත ගාල්ල ප්‍රාදේශීය කාර්යාලය මෙහෙයවීමෙන් 2024.04.22 දින විශේෂ වෙරළ පවිත්‍රතා වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව හික්කඩුව වෙරළ ආශ්‍රිත ප්‍රදේශයේ අපද්‍රව්‍ය ඉවත්කර සම්පූර්ණයෙන්ම පිරිසිදු කිරිමට සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය ක්‍රියා කරන ලදි.




DATE - 2024.06.05

## ජගත් පරිසර දිනය වෙනුවෙන් බෙන්තොට වෙරළ තීරය පිරිසිදු කිරීමේ වැඩසටහනක්

2024 ජූනි 05 දිනට යෙදී තිබුන ජගත් පරිසර දිනය වෙනුවෙන් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය සංවිධානයෙන් බෙන්තොට වෙරළ තීරය පිරිසිදු කිරීමේ වැඩසටහනක් පැවැත්විණි. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය ගාල්ල ප්‍රාදේශීය කාර්යාලය, සංවිධානයෙන් පැවති මෙම වෙරළ පවිත්‍රතා වැඩසටහන සඳහා බෙන්තර හෝටල් ප්‍රජාව ප්‍රදේශවාසීන් සමඟ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරීයේ සාමාන්‍යාධිකාරී ජගත් ගුණසේකර මහත්මා අධිකාරියේ ගාල්ල ප්‍රාදේශීය කාර්යාලයේ නිලධාරීන් සහ Clean Ocean Force සංවිධානයේ ජෙරම් ප්‍රනාන්දු ඇතුළු නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් මෙම වෙරළ පවිත්‍රතා වැඩසටහන සාර්ථකව පවත්වන ලදී.





## යාල වනජීවි කලාපය තුළ 749kg සමුද්‍රීය අපද්‍රව්‍ය

DATE - 2024.04.24

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය සංවිධානයෙන් යාල වනජීවි කලාපය තුළ කිලෝමීටර් 20ක වෙරළ ප්‍රදේශයක වෙරළ පවිත්‍රතා කටයුතු සිදු කරමින් 749kg සමුද්‍රීය අපද්‍රව්‍යඑම වෙරළ තීරයන්ගෙන් ඉවත් කරන ලදි.



MEPA NEWS LETTER
MARINE ENVIRONMENT PROTECTION AUTHORITY

# 2024 Media Dairy

DATE - 2024.02.04

## 76 වන ජාතික නිදහස් දිනය සැමරීම



76 වන ජාතික නිදහස් දිනය සැමරීම වෙනුවෙන් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ , කළුතර ප්‍රාදේශීය කාර්යාලය විසින් කඩොලාන පැල සමග වෙරළ ආශ්‍රිත වැවෙන වෙනත් පරිසර හිතකාමී පැළ 300 ක් රෝපණය කිරීමේ වැඩසටහනක් කළුතර කැලිඩෝ වෙරළ ආශ්‍රිත ප්‍රදේශයේදී සිදු කල අවස්ථාව

මේ සඳහා

Clean Ocean Force
Kaluganthota Volunteer Force
Helavatharanaya
Volunteer Sri Lanka

යන රාජ්‍ය නොවන සංවිධාන හා ස්වෙච්චා සංවිධාන සහයෝගය ලබාදුන් අතර මෙම කඩොලාන පැල සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් පවත්වා ගෙන යනු ලබන කඩොලාන පැල තවාන මගින් ලබා ගත් ඒවා වීම විශේෂයකි.

DATE - 2024.01.17

## Bio Fouling පිළිබඳව දැනුවත් කිරීමේ පුහුණු වැඩමුළුව .

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් සංවිධානය කරන ලද Bio Fouling පිළිබඳව දැනුවත් කිරීමේ පුහුණු වැඩමුළුවක් 2024.01.17 සහ 18 යන දිනයන්හී ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පවතවන ලදි. අන්තර්ජාතික සමුද්‍රීය සංවිධානය (IMO) මගින් Bio Fouling පාලනය පිළිබඳ මාර්ගෝපදේශන සංග්‍රහයක් ඉදිරිපත් කර ඇති අතර "Glo Fouling " ව්‍යාපෘතිය මගින් Bio Fouling පාලනයට අදාළ කටයුතු සිදු කරයි.එම ව්‍යාපෘතියේ අනුග්‍රහක දායකත්වය යටතේ පැවති මෙම පුහුණු වැඩමුළුව ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානයේ Bio Fouling පිළිබඳ උපදේශක ආචාර්ය Ashley Coutts විසින් මෙහෙයවන ලදී.



මේ අවස්ථාව සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සභාපති අසේල බී. රැකව , අධිකාරියේ සාමාන්‍යාධිකාරී ජගත් ගුණසේකර යන මහත්වරුන් සමග අධිකාරී තාක්ෂණික අංශයේ නිලධාරින් ,අදාළ රාජ්‍යසභ පුද්ගලික අංශ නියෝජනය කරමින් නිලධාරීන් 70 ක් පමණ සහභාගි විය .

DATE - 2024.02.01

## කඩොලාන පැළ දහසක් රෝපණය කිරීම.

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය සංවිධානය කිරීමෙන්, වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මග පෙන්වීම යටතේ සහ ඇන්සල් ලංකා පුද්ගලික සමාගමේ අනුග්‍රාහක දායකත්වය සමගින් කඩොලාන පැළ දහසක් රෝපණය කිරීමේ වැඩසටහනක් පසුගියදා ආරච්චිකට්ටුව, වයිරන් කට්ටුව කලපුව ආශ්‍රිත ප්‍රදේශයේ දී සිදු කරන ලදී. මෙම කාර්යය සඳහා වයිරන්කට්ටුව ප්‍රදේශයේ ධීවර ප්‍රජාව නොමද සහයෝගයක් ලබා දෙන අතර කඩොලාන පැළ රෝපණය කිරීමෙන් පසු, රැක බලා ගැනීමේ කාර්යය එම ධීවර ප්‍රජාව විසින් සිදු කිරීමට ඔවුන් කටයුතු කරනු ඇත.



හඳුනාගත් කලපු ආශ්‍රිත ස්ථාන කීපයක මෙම කඩොලාන පැළ රෝපණය කිරීම සිදු කළ අතර මේ සඳහා ඇන්සල් ලංකා පුද්ගලික සමාගමේ ජ්‍යේෂ්ඨ අධ්‍යක්ෂක සහ සාමාන්‍යාධිකාරී රමේෂ් නානායක්කාර මහතා ඇතුළු එහි කාර්ය මණ්ඩලය සියයකට අධික ප්‍රමාණයක් සහභාගි විය. මීට අමතරව වයිරන්කට්ටුව ධීවර ජනතාව මේ සඳහා සහභාගි විය.

# 2024 Media Dairy

"වෙරළ හා ධීවර වරායන්හි අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සක්‍රිය යාන්ත්‍රණයක් "
සැකසීම වෙනුවෙන් වූ දෙවන රැස්වීම





DATE - 2024.02.19

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය සංවිධානයෙන් හා අපද්‍රව්‍ය කළමනාකරණයට සම්බන්ධ සියලු රාජ්‍ය ආයතන එක්ව සිදුකරගෙන යනු ලබන "වෙරළ හා ධීවර වරායන්හි අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සක්‍රිය යාන්ත්‍රණයක්" සැකසීම වෙනුවෙන් වූ දෙවන රැස්වීම පසුගිය 2024/02/19 දින කොළඹ Cinnamon Grand හෝටලයේදී පැවැත්විණි. පසුගිය වසරේදී පැවති පළමු රැස්වීමේදී ඇතිකරගත් එකඟතාව පරිදි "වෙරළ හා ධීවර වරායන්හි අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සකසන ලද යෝජනාවලිය සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් මෙහිදී ඉදිරිපත් කරන ලදී .මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සභාපති අසේල. බී. රැකව මහතාගේ සහ එහි සාමාන්‍යාධිකාරී ජගත් ගුණසේකර මහතාගේ ආරාධනයෙන් ජනාධිපති ජේෂ්ඨ උපදේශක රුවන් විජේවර්ධන මැතිතුමා සහභාගී වූ අතර පරිසර අමාත්‍යංශයේ ලේකම් තුමන් , මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති තුමන්, ධීවර සංස්ථාවේ සභාපති තුමන් ඇතුළු මෙම ක්ෂේත්‍රය හා සම්බන්ධ ආයතන 34 ක ප්‍රධානීන් සමග රාජ්‍ය නොවන සංවිධානයන්හි නියෝජිතයින් ද මේ අවස්ථාවට සහභාගී විය.මෙම යෝජනාවලිය අනුව වෙරළ ආශ්‍රිත කලාපයේ අපද්‍රව්‍ය කළමනාකරණයට සම්බන්ධිත සියලු ආයතන නියෝජනය වන පරිදි වෙරළ කලාපය කළමනාකරණය සඳහා කමිටු ස්ථාපනය කිරීම සිදු කරනු ලබයි. මෙමගින් වෙරළ කලාපය හා ධීවර වරායන් තුල පරිසර දූෂණය පාලනය කිරීම , අවම කිරීම හා වැළැක්වීම සඳහා අවශ්‍ය වන ක්‍රියාමාර්ග කඩිනමින් සිදු කිරීමට හැකිවනු ඇත. තවද මේ අවස්ථාවේදී වෙරළ හා ධීවර වරායන්හි අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදය වඩාත් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම අරමුණු කර ගනිමින් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය මගින් මේ හා සම්බන්ධ සුහුරු තාක්ෂණය ඔස්සේ Mobile Application හඳුන්වා දීමද සිදු කෙරිණි. එසේම මෙම Mobile Application අදාළ සියලු පාර්ශ්වයන්ගේ එකඟතාව මත ඉතා කෙටි කාලයක් ඇතුලත ක්‍රියාවට නැංවීමට අවශ්‍ය සියලු කටයුතු සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් සිදු කරමින් පවතින බව අධිකාරියේ සභාපති නීතිඥ අසේල බී. රැකව මහතා සඳහන් කළ අතර එම Mobile Application හඳුන්වා දීම පිළිබඳව එම අවස්ථාවට පැමිණි බොහෝ ආයතන ප්‍රධානීන් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වෙත තම ස්තූතිය පුද කරන්න ලදී.මෙම යෝජනාවලීන් ක්‍රියාවට නැංවීම තුලින් වෙරළ කලාපය හා ධීවර වරායන් තුල පරිසර දූෂණ වැළැක්වීම හා පාලනය කිරීම සඳහා එම විෂයන්ට ආදාළ ආයතන සතු වගකීම තවදුරටත් තහවුරු කර ගනිමින් එම ආයතන සාමූහිකත්වයෙන් ක්‍රියාත්මක වෙමින් මේ වනවිටත් පිහිට වනු ලැබූ ජාතික කමිටු හා දිස්ත්‍රික් කමිටු හා පළාත් පාලන ආයතන මට්ටමින් පිහිටුවනු ලැබූ ප්‍රාදේශීය කමිටු හරහා ඵලදායී ලෙස වෙරළ කලාපයන් , ධීවර කලාපය තුළ අපද්‍රව්‍ය කළමනාකරණය සිදු කිරීමට අපේක්ෂා කරනු ලැබේ. මෙමගින් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය අරමුණු කර ගනු ලැබුවේ වෙරළ කලාපය හා ධීවර කලාපයන් තුල පරිසර දූෂණය පාලනය කිරීම ක්‍රම අවම කිරීම හා වැළැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් සිදු කිරීමත්, වෙරළ කලාපය හා ධීවර කලාපයන්හී සුරක්ෂිතතාව තහවුරු කරමින් ශ්‍රී ලංකව ජාත්‍යන්තරයට එකඟ වී ඇති ගෝලීය සංවර්ධන ඉලක්ක සපුරාලමින් මහජනතාවටත් විදේශීය සංචාරකයින්ටත් වඩාත් ආකර්ශනීය ස්ථාන ලෙස වෙරළ හා ධීවර වරායන් පවත්වා ගෙන යාම, පමණක් නොව ජාතික ඩෙංගු මර්දන වැඩසටහන සඳහා ද දායක වීම තුළින් නිරෝගී මතු පරපුරක් රටට දායාද කිරීම සඳහන් කළ හැක.

MEPA NEWS LETTER
MARINE ENVIRONMENT PROTECTION AUTHORITY

# 2024 Media Dairy

## වෙරළ , ධිවර වරාය හා සාගර කලාප දූෂණයෙන් තොරව පවත්වාගෙන යාම සදහා කඩිනම් ව්‍යාපෘති

DATE - 2024.03.25



ශ්‍රී ලංකාවේ ආර්ථික දියුණුව සදහා ශ්‍රී ලංකාවේ වෙරළ කලාපය මෙන්ම සාගර කලාපය දූෂණයෙන් තොරව පවත්වාගෙන යාම අතිශයින් වැදගත් වේ. මේ සම්බන්ධයෙන් ප්‍රධාන වගකීමක් දරණ රාජ්‍ය ආයතනයක් වශයෙන් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය හැදින්විය හැකිය. මේ වනවිට අධිකාරියේ සභාපති අසේල බී. රැකව මහතාගේ උපදෙස් මත වෙරළ හා සාගර කලාප දූෂණයෙන් තොරව පවත්වාගෙන යාම සදහා කඩිනම් ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කරමින් පවතින අතර මෙම වැඩසටහන් වඩාත් ක්‍රමවත්ව ඉදිරියට ගෙනයාම සදහා මේ හා සම්බන්ධ රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන සංවිධානයන්හී සහයෝග අත්‍යවශ්‍ය වන බැවින් එම ආයතන සමග සහයෝගයෙන් අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය කටයුතු කරමින් පවතී. ඒ යටතේ වෙරළ හා ධීවර වරායන්හි අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබද යෝජනාවලියක් සකසා ඇත. මේ සම්බන්ධයෙන් වූ විශේෂ සාකච්ඡාවක් ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානියා හා ජනාධිපති ජේෂ්ඨ උපදේශක සාගල රත්නායක මහතාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති ලේකම් කාර්යාලයේදී පසුගියදා පැවැත්විණි. මෙහිදී සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් මේ වන විට ක්‍රියාත්මක ව්‍යාපෘති හා වැඩසටහන් පිලිබදව අධිකාරියේ සාමාන්‍යාධිකාරි ජගත් ගුණසේකර මහතා විසින් පැහැදිලි කරන ලදී. ඒ අනුව වෙරළ හා ධීවර වරායන්හි අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබද වැඩසටහන සහ යෝජනාවලිය වෙරළ හා ධීවර වරයන්හි අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා හඳුන්වා දෙනු ලබන සුහුරු තාක්ෂණය ඔස්සේ භාවිතයට ගත හැකි ජංගම යෙදුම (Mobile Application) නිලධජ වෙරළ (ස්ථාපිත කිරීමේ ) ව්‍යාපෘතිය - Blue Flag Beach හදිසි තෙල් විසිරීමකදී හෝ රසායනික ද්‍රව්‍ය විසිරීමකදී ක්‍රියාත්මක ජාතික සැලැස්ම (NOSCOP) යාවත් කාලීනකිරීම සහ ඒවැනි අවස්ථාවකදී ක්‍රියාත්මක වීම සදහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ මේ වනවිට ස්ථාපිත කරමින් පවතින මෙහෙයුම් මැදිරිය (Operation Room) යන ව්‍යාපෘති හා වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කිරීම පිලිබදව මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡාවට ලක්විය.සාගර සහ වෙරළ තීරයේ පවිත්‍රතාව රැක ගනිමින් තිරසර සාගර සහ වෙරළ කලාපයක් සහතික කිරීම සදහා වගකීම් පැවරී ඇති සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය ඇතුළු සියලු ආයතන කැපවිය යුතු බවට සාගල රත්නායක මහතා විසින් මෙහිදී පෙන්වාදුන් අතර එම කටයුතු වඩාත් පහසුකර ගැනීමට මෙම නව ජංගම යෙදුම පිටිවහලක් වනු ඇති බවට සඳහන් කළේය. එමෙන්ම වෙරළ පවිත්‍රතා වැඩසටහන් මෙන්ම වෙරළ පවිත්‍රතාව රැක ගැනීම පිළිබඳව දැනට ක්‍රියාත්මක කෙරෙන අධ්‍යාපන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පුළුල් කිරිමේ අවශ්‍යතාව ද පෙන්වා දුන් සාගල රත්නායක මහතා වෙරළාශ්‍රිත කලාපයන්හි සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමට රජය ගෙන යන වැඩපිළිවෙළට එය මනා දායකත්වයක් වනු ඇති බවද තවදුරටත් පෙන්වාදෙන ලදී. ගංගා, ඇල දොළ මාර්ගයෙන් ගලා එන අපද්‍රව්‍ය , දිගු මුදාහැරීමේ නළ මාර්ග ඔස්සේ මල අපද්‍රව්‍ය හා අප ජලය මුදාහැරීම මෙන්ම ධීවර වරායන් ආශ්‍රිතව ඉවත ලන අපද්‍රව්‍ය හා වෙනත් ගොඩබිම් ක්‍රියාකාරකම් මගින් වෙරළ හා සාගර සම්පත් දැඩි ලෙස අපවිත්‍ර වන බව සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් පෙන්වා දුන් අතර විවිධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන මෙන්ම රාජ්‍ය නොවන සංවිධානවල මැදිහත් වීමෙන් එම වෙරළ පවිත්‍රතා වැඩසටහන් සිදු කෙරෙන බවත්, එම කටයුතු මනා ලෙස සම්බන්ධීකරණය කිරීම සදහා මෙම ජංගම යෙදුම භාවිතයට ගැනීමට අපේක්ෂා කරන බවත් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සභාපති අසේල බී.රැකව මහතා විසින් වැඩිදුරටත් සඳහන් කරන ලදි .පරිසර අමාත්‍යාංශයේ ලේකම් ප්‍රභාත් චන්ද්‍රකීර්ති, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් ඩබ්.එස්. සත්‍යානන්ද යන මහත්වරු , නාවික හමුදාපති, පොලිස්පති ඇතුලු ආරක්ෂක අංශ ප්‍රධානිහු ඇතුළු රාජ්‍ය නිලධාරීහු සහ රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයින් පිරිසක් මෙම සාකච්ඡාවට එක්විය .







සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

# 2024 Media Dairy

**DATE - 2024.07.24**

දකුණු පළාතේ මිරිස්ස ආශ්‍රිත වෙරළ කලාපයයේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරිම අරමුණු කර ගනිමින් මිරිස්ස ආශ්‍රිත වෙරළ කලාපය සමුද්‍ර අභය භූමියක් බවට පත් කිරිම හා මිරිස්ස ආශ්‍රිත වෙරළ කලාපය හඳුනාගත් වෙරළ කලාපයක් නීල ධජ වෙරළ තීරයක් බවට පත් කිරීම වෙනුවෙන් කැබිනට් අනුමැතිය හිමි වී ඇත. ඒ අනුවසමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් නීල ධජ වෙරළ තීරයක් ඇති කිරීමට අදාලව පළමු පියවර තබමින් මිරිස්ස නීල ධජ වෙරළ ස්ථාපිත කිරීම අදාල වෙරළ කලමණාකරන කමිටු පිහිට වීම 2024.07.24 දින මාතර දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලයේදී පැවැත්විණි.මේ අවස්ථාවට සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සාමාන්‍යාධිකාරී ජගත් ගුණසේකර මහතා, මාතර අතිරේක දිස්ත්‍රික් ලේකම් කාංචනා කේ.තල්පාවිල මහත්මිය, මිරිස්ස ප්‍රාදේශීය ලේකම් ටී.එල්.එන්.එස් මෙන්ඩිස් මහත්මිය ඇතුළු අදාල රාජ්‍ය ආයතන නිලධාරීන් , මිරිස්ස ආශ්‍රිත සංචාරක කර්මාන්තයන්හී යෙදී සිටින පිරිස් , සහ මිරිස්ස ධීවර ජනතාවද මේ අවස්ථාවට සහභාගි විය.



## ශ්‍රී ලංකා සබරගමු විශ්වවිද්‍යාලයේ සිසු සිසුවියන් වෙනුවෙන් සමුද්‍රීය පරිසර ක්ෂේත්‍ර පිලිබදව දැනුවත් කිරීමේ වැඩසටහන .



**DATE - 2024.08.06**

ශ්‍රී ලංකා සබරගමු විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික පීඨයේ ස්වභාවික සම්පත් අධ්‍යයන අංශයේ සිසු සිසුවියන් වෙනුවෙන් සමුද්‍රීය පරිසර අධිකාරියේ කාර්යභාරය හා සමුද්‍රීය පරිසර ක්ෂේත්‍ර පිලිබදව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2024.08.06 දින සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේදී පැවැත්විණි.

# 2024 Media Dairy



DATE - 2024.09.10

සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරියේ මෙහෙයුම් මැදිරිය විවෘත කළ අවස්ථාව .

# 2024 Media Dairy

## සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් කොළඹ වරාය තුළ නවීකරණය කරන ලද කාර්යාලය විවෘත කිරීම - (2024.08.13)













සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් සිදු කරනු ලබන ප්‍රධානතම කාර්යක් වන වරාය වෙත පැමිණෙන නෞකාවන් වෙනුවෙන් අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් සැපයීම හා නෞකා පරීක්ෂණ කටයුතු සිදු කිරීම වෙනුවෙන් කොළඹ වරාය පරිශ්‍රය තුළ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ කාර්යාලයක් පවත්වා ගෙන ගිය අතර එය ඉතා අබලන් තත්වයේ හා පහසුකම් වලින්ද තොරව පැවති බැවින් නැවත එම කාර්යාලය අලුත්වැඩියා කර සියලු පහසුකම් වලින් සමන්විත කාර්යාලයක් වශයෙන් අද දින විවෘත කරන ලදී. ඒ අනුව සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් සිදු කරනු ලබන නෞකා අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ කටයුතු කාර්යක්ෂමව හා විධිමත්ව සිදු කිරීමට හැකි වන අතරම නෞකා පරීක්ෂණ සේවාවන් තවදුරටත් පුළුල් කරමින් සිදු කිරීමේ හැකියාව මෙම කාර්යාලය වැඩි දියුණු කිරීම මගින් අපේක්ෂා කරයි. තවද මෙම කාර්යාලය පැය 24 පුරාම විවෘතව පවතින අතරම වරාය තුළ සිදු විය හැකි හදිසි තෙල් විසිරීමකදී හෝ රසායන ද්‍රව්‍ය විසිරීමකදී ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීම වෙනුවෙන් වූ මෙහෙයුම් මැදිරියක් වශයෙන්ද ක්‍රියාත්මක කිරීමේ පහසුකම් වලින් මෙම කාර්යාලය සමන්විත වේ. මේ අවස්ථාව සදහා ප්‍රධාන ආරාධිත අමුත්තන් වශයෙන් වරාය නාවික හා ගුවන් සේවා අමාත්‍යගරු නිමල් සිරිපාලද සිල්වා මැතිතුමා, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශයේ ලේකම් ඩබ්.එස් සත්‍යානන්ද යන මහත්වරුන් සහ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සභාපති අසේල බී. රැකව මහතා, සාමාන්‍යධිකාරී ජගත් ගුණසේකර මහතා ඇතුළු අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයන් එක් විය.

MEPA NEWS LETTER
MARINE ENVIRONMENT PROTECTION AUTHORITY

# 2024 Media Dairy

DATE - 2024.03.02

## තෙල් හා රසායනික ද්‍රව්‍ය විසිරීමකදී ක්‍රියාත්මක වැඩපිළිවෙළ










එහි එක් පියවරක් වශයෙන් එක්සත් රාජධානියේ OCP (ocean country partner-ship) වැඩසටහනේ අනුග්‍රාහක දායකත්වය යටතේ වැඩසටහන් රැසක් මේ වන විට සාර්ථකව ක්‍රියාත්මක කරමින් පවතී .සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය මගින් තෙල් හා රසායනික ද්‍රව්‍ය විසිරීමකදී ක්‍රියාත්මක වැඩපිළිවෙළ ශක්තිමත් කිරීම සඳහා විවිධ පියවර ගනිමින් තිබේ .

අධිකාරියේ සභාපති නීතිඥ අසේල බී.රැකව මහතාගේ උපදෙස් මත හා එහි සාමාන්‍යාධිකාරී ජගත් ගුණසේකර මහතාගේ මග පෙන්වීම යටතේ හදිසි තෙල් විසිරීමකදී හෝ රසායනික ද්‍රව්‍ය විසිරීමකදී ක්‍රියාත්මක ජාතික සැලැස්ම මේ වනවිට කඩිනමින් සකසමින් පවතින අතර මීට සමගාමීව වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරමින් පවතී .

# This Year's Beach Cleanup Program

DATE - 2024.06.09

## ජගත් සාගර දිනය නිමිත්තෙන් clean ocean force  සංවිධානය සමඟ වෙරළ පවිත්‍රතා වැඩසටහන




ජගත් සාගර දිනය නිමිත්තෙන් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය clean ocean force  සංවිධානය සමග මට්ටක්කුලිය කාක දූපත වෙරළ තීරයේදී සිදුකරන ලද විශේෂ වෙරළ පවිත්‍රතා වැඩසටහන මේ සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සභාපති අසේල බී.රැකව, එහි සාමාන්‍යාධිකාරී ජගත් ගුණසේකර  clean ocean force භාපති ජෙරම් ප්‍රනාන්දු , ත්‍රිවිධ හමුදාව , ශ්‍රී ලංකා පොලිසිය, රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන සංවිධානයන්හි සාමාජික සාමාජිකාවන් තුන්සිය දෙනෙකුගේ පමණ සහභාගිත්වයෙන් මෙම වෙරළ පවිත්‍රතා වැඩසටහන  සාර්ථකව පවත්වන ලදී.

# 2024 Media Dairy

**DATE - 2024.10.16**

## රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේදී සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් පවත්වන ලද මාධ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන

## චන්ද්‍රිකා තාක්ෂණය මත පදනම්ව තෙල් කාන්දු වීම් නිරීක්ෂණය



චන්ද්‍රිකා තාක්ෂණය මත පදනම්ව තෙල් කාන්දු වීම් නිරීක්ෂණය කිරීමේ පළමු පියවර අවසන් කිරීම හා එහි ප්‍රගති සමාලෝචනය - 2024/10/16

ප්‍රංශ රජය හා ශ්‍රී ලංකා රජය අතර ඇතිකර ගන්නා වූ එකඟතාවය අනුව චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ තෙල් විසිරීම් හඳුනාගැනීම සඳහා වූ එක් අවුරුදු වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී ප්‍රංශ රජය වෙනුවෙන් සී එල්.එස් ආයතනය සහ ශ්‍රී ලංකා රජය වෙනුවෙන් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය 2023 සැප්තැම්බර් 12 වන දින ගිවිසුම් ප්‍රකාරව චන්ද්‍රිකා තාක්ෂණය මගින් ශ්‍රී ලංකාවට අයත් මුහුදු කලාපයේ සිදුවන තෙල් විසිරීම් හඳුනා ගැනීම සහ එමගින් හඳුනා ගනු ලබන දූෂකයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම සම්බන්දව එක් අවුරුදු ව්‍යාපෘතියක් ක්‍රියාවට නංවන ලදී. තවද මෙම ව්‍යාපෘතිය මඟින් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ නිලධාරීන් හට එම ක්‍රමවේදයේ ක්‍රියාකාරීත්වය පිලිබද තාක්ෂණික පුහුණුවක් ලබාදීමත් මෙමගින් සිදු කරන ලදී. ඒ අනුව සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ නිලධාරීන් චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ ලැබෙන ඡායාරූප විශ්ලේෂණය කර තෙල් විසිරීම් හඳුනා ගැනීම සහ අදාළ දූෂක ප්‍රභවයන් හඳුනා ගනිමින් ඊට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදී. එනම් මෙම ව්‍යාපෘතිය සිදුකළ කාලසීමාව තුළදී චන්ද්‍රිකා ඡායාරූප විශ්ලේෂණය මගින් එම කාල වකවානුව තුළ දූෂණයන් සිදුකළ නෞකා සඳහා නීතිමය පියවර ගනු ලැබීය. 2024 වසර තුළදී තෙල් විසිරීම් සිදුකළ බවට හඳුනාගනු ලැබූ නෞකා එකොළහකට නීතිය ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇති අතර 2024 වසරේ පෙබරවාරි මාසය තුළදී MT Global Crest නෞකාවට විරුද්ධව නීතිමය පියවර ගැනීම තුළින් රුපියල් මිලියන 15ක මුදලක් දඩ වශයෙන් අය කර ගැනීමටත් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියට හැකි විය. වසරක නියමු ව්‍යාපෘතියක් වශයෙන් සිදුකරන ලද මෙම ව්‍යාපෘතිය පළමු අදියර අවසන් කිරීම සිදුකරන අතර එය ශ්‍රී ලංකාවට අයත් ජල තීරය දූෂණයෙන් තොරව ආරක්ෂා කිරීම වෙනුවෙන් වූ සාර්ථක ව්‍යාපෘතියක් වශයෙන් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය හඳුනා ගෙන ඇත. එහි දෙවන අදියරය ආරම්භ කිරීම මගින් ශ්‍රී ලංකා ජල තීරය තුළ නෞකා මගින් සිදු කරනු ලබන අනිසි තෙල් බැහැර කිරීම් හෙවත් තෙල් විසිරීම් හඳුනා ගනිමින් ඒ පිළිබඳව නීතිය ක්‍රියාත්මක කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. මෙය අප ජල තීරයේ දූෂණයන් අවම කරගනිමින් සමුද්‍රීය පරිසරය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් වූ වැදගත් පියවරක් වශයෙන් හඳුනා ගත හැකිය. එම දින මෙම ව්‍යාපෘතිය අවසන් කිරීම සංකේතවත් කිරීම සඳහා ප්‍රංශ රජයේ ශ්‍රී ලංකා තානාපති (වැඩ බලන) Marie-Noëlle Duris, chargée d'affaires මහත්මිය, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වෙනුවෙන් එහි සාමාන්‍යාධිකාරී ජගත් ගුණසේකර මහතා, ප්‍රංශයේ CLS ආයතනයේ ජාත්‍යන්තර ප්‍රවර්ධන නියෝජිත හා වැඩසටහන් මෙහෙයුම් නිලධාරී Oliver Germain යන නිලධාරීන් සමග පරිසර අමාත්‍යාංශය, ධීවර දෙපාර්තමේන්තුව, නාරා ආයතනය, නාවික හමුදාව, ගුවන් හමුදාව, වෙරළ ආරක්ෂක බලකාය, වෙළඳ නාවික අධ්‍යක්ෂ කාර්යංශය, මධ්‍යම පරිසර අධිකාරිය, ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානය සහ ආපදා කළමණාකරන මධ්‍යස්ථානය යන ආයතනයන්හි නිළධාරීන් මේ අවස්ථාවට සහභාගී විය. එසේම අධිකාරියේ හිටපු සභාපති නීතිඥ අසේල බී රකව මහතාද මේ අවස්ථාවට සහභාගි විය.







**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය**

கடல்சார் சூழல் பாதுகாப்பு அதிகாரசபை

**MARINE ENVIRONMENT PROTECTION AUTHORITY (MEPA)**